# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2080/36 - 2018 ජූලි මස 18 වැනි බදාදා - 2018.07.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයේ 1 වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ 11 වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2018 ජූලි මස 19 වැනි දින සිට ආරම්භ වන වසරක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 ජූලි මස 18 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| 1. | 03.05 | 0305.59.10 | උම්බලකඩ සහ ඒ සඳහා ආදේශක | කි. ග්‍රෑමයට රු. 102.00 |
| 2. | 09.04 | 0904.21.10 | මිරිස් - වියලි, කුඩු නොකළ හා නොඇඹරූ | කි.ග්‍රෑමයට රු. 25.00 |
| | | 0904.22.10 | මිරිස් - කුඩුකළ හෝ ඇඹරූ | කි.ග්‍රෑමයට රු. 125.00 |
| | | 0904.22.90 | අනෙකුත් - කුඩුකළ හෝ ඇඹරූ | කි.ග්‍රෑමයට රු. 125.00 |

උපලේඛනය (සම්බන්ධිතයි)

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 3. | 09.09 | 0909.21 | කොත්තමල්ලි බීජ - කුඩු කළ හා නොඇඹරූ | කි.ග්‍රෑමයට රු. 26.00 |
| | | 0909.22 | කොත්තමල්ලි බීජ - කුඩු කළ හෝ ඇඹරූ | කි.ග්‍රෑමයට රු. 52.00 |
| 4. | 09.10 | 0910.30.10 | කහ - කුඩු නොකළ හා නොඇඹරූ | කි.ග්‍රෑමයට රු. 102.00 |
| | | 0910.30.90 | කහ - අනෙකුත් | කි.ග්‍රෑමයට රු. 360.00 |
| 5. | 11.06 | 1106.10.10 | උඳු පිටි | කි.ග්‍රෑමයට රු. 200.00 |
| 6. | 16.04 | 1604.11 | සැමන් | කි. ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.12 | හුරුල්ලන් | කි. ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.13 | සාඩින්, සාඩිනෙල්ලා සහ බ්‍රිස්ලින් හෝ හාල්මැස්සන් | කි. ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.14 | ඇටවල්ලා, ස්කිප්ජැක් සහ බොනිටෝ (සර්ඩා විශේෂයෙන්) | කි. ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.15 | මැකරල් | කි. ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.16 | ඇන්චෝවිස් | කි. ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.17 | ආදන් | කි. ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.19 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 50.00 |
| | | 1604.20 | අනෙකුත් සකස් කළ හෝ සුරක්ෂිත මාලු | කි. ග්‍රෑමයට රු. 50.00 |
| 7. | 04.06 | 0406.20 | සියළුම වර්ගවල, පෙරන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු | කි. ග්‍රෑමයට රු. 200.00 |

08 - 162/1

---

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

නිවැරදි කිරීමේ දැන්වීම

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2018 ජූනි මස 14 වැනි දින සිට ආරම්භ වන වසරක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2018.03.19 දිනැති අංක 2063/13 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් සංයෝජිත වර්ගීකරණ අංක 0713.31.29 යටතේ වන උඳු සඳහා ප්‍රකාශිත අදාළ නියමය 2018 ජුනි මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 ජුනි මස 13 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | |
| 1. | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් | |
| | | 0303.89.90 | අනෙකුත් - තලපත් (Istiophorus platypterus), කොප්පරා මසුන් (Makaira spp) සහ තෝරා මසුන් (Narrow - barred Spanish mackerel/Scomberomorus commerson) පමණක් | කි. ග්‍රෑමයට රු. 25.00 |
| 02 | 08.01 | | අළුත් හෝ වියළි, පොතු ගැලවූ හෝ නොගැලවූ හෝ ලෙලිගැසූ හෝ නොගැසූ, පොල්, බ්‍රසීල ගෙඩි සහ කජු ගෙඩි | |
| | | 0801.19.90 | අනෙකුත් - පොල් මද | කි. ග්‍රෑමයට රු. 1.00 |
| 03 | 07.13 | 0713.31.29 | අනෙකුත් - උඳු | කි. ග්‍රෑමයට රු. 150.00 |

08 - 162/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.